චක්‍රලේඛ අංක 07/2015 (1)

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත,

18/9 වයිමන් පාර,

නල්ලූර්.

2016.04.26

උතුරු පළාතේ සියළුම සමූපකාර ආයතනවල සහ සංගම්වල සභාපතිවරුන් වෙත.

**සමූපකාර සේවකයින්ට එරෙහිව විනය කටයුතු කඩිනම් කිරීම**

ඉහත සඳහන් චක්‍රලේඛයේ උප වගන්ති 5.2 සහ 8.5 ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් සංශෝධන උප වගන්ති ආදේශ කරනු ලැබේ.

5.2 විනය පරීක්ෂණය උපරිමය වර්ෂයක් ඇතුලත නිම කර විනය නියෝගය නිකුත් කිරීමට විනය පරීක්ෂණ නිලධාරී කටයුතු කල යුතුය. චෝදනා ලැබූ නිලධාරියාගේ ප්‍රමාදයෙන් පරීක්ෂණය ප්‍රමාද වන අවස්ථා හැර වෙනයම් හේතුවක් මත එම පරීක්ෂණය නිම කර විනය නියෝගය නිකුත් කිරීමට වර්ෂයකට අධික කාලයක් ප්‍රමාද වේ නම් අදාල චෝදනාව ලැබූ සේවකයා වැඩ තහනමට ලක්වී ඇත්නම් ඔහුව නැවත සේවයේ පිහිටුවා එදින සිට ඔහුට වැටුප් ගෙවිය යුතුය. එතෙක් නොගෙවන ලද වැටුප් සම්බන්ධව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් වන අයුරින් ක්‍රියා කල යුතුය.

8.5 කොමිෂන් සභාවට අභියාචනයක් ලැබීමෙන් පසු එම අභියාචනා විභාගයට අදාල තොරතුරු කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින විට සමිතිය අප්‍රමාදව නියමිත තොරතුරු සැපයිය යුතුය.

අත්සන

පී. වාකීසන්,

P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council

ලේකම්.

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත.